# නූතන බටහිර දර්ශනය පිළිබඳ අධ්‍යයනයක්

## A study of modern Philosophy

**ගෝනලගොඩ නන්ද හිමි**


**Abstract**

In terms of modern western Philosophy, it seems to be a turning point of Western philosophy. Modern philosophy is the third one among the four periods of Western philosophy. There was no free - will of thinking in anything except existence of God in Medieval philosophy. Then, the 'Believing and 'Dogmatic' were the method of philosophical of medieval philosophy. It was not challenged by anyone under the supervision of the supremacy of the Church, however the Scientific Revolution and the Renaissance stood against it and Modern philosophy was appeared. Although René Descartes was the father of modern philosophy, philosophers such as Niccolo Machiavelli, Thomas Hobbes, Galileo Galilei, and Kepler have also commented philosophical thoughts before him. Accordingly, Modern philosophy begins with René Deckard. Rationalism and Empiricism can be seen in Modern Western Philosophy and thoes two main parts were brought in together by Immanuel Kant. There are no significant unanimous ideas of the end of the modern philosophy. In this article, I have discussed that issue and my argument is that Hegel could be the last philosopher of modern philosophy. I have followed the content analysis method as search methedoloy. The objectives of this research are to find the nature of modern philosophy and understand the differences of philosophical ideas in Modern philosophy.

**Keywords:-** Empiricism, Medieval Philosophy, Modern Philosophy, Rationalism

### හැඳින්වීම

බටහිර දර්ශනයෙහි තුන්වන අවධිය වශයෙන් සාකච්ඡා වන නූතන බටහිර දර්ශනය මධ්‍යතන යුගයෙන් පසුව බිහිවන්නකි. මධ්‍යතන දාර්ශනික අවධියෙහි පැවති අඳුරු බව නවතාලමින් බිහි වූ නූතන දර්ශනයෙහි දාර්ශනික එලඹුම් කිහිපයක් ඇත. මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කරනුයේ එම දාර්ශනික එලඹුම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කිරීමය. එහිදී මධ්‍යකාලීන දර්ශනය හා නූතන දර්ශනය අතරමැදි තත්වය නියෝජනය කරනු ලබන කාලයෙහි සිදු වූ දාර්ශනික ප්‍රවනතා පිළිබඳ කෙටියෙන් විමසා බැලීමක් සිදු වේ. නූතන දර්ශනයෙහි අවසාන දාර්ශනිකයා සම්බන්ධයෙන් පවතින මතභේද පිළිබඳ විග්‍රහයක් කොට හේගල් එහි අවසාන දාර්ශනිකයා වශයෙන් සැලකීමෙහි යුක්ති යුක්ත භාවය සම්බන්ධයෙන් ද කරුණු දක්වාලීමට අපේක්ෂා කෙරේ. අනතුරුව ඩෙකාට්ගේ සිට හේගල් දක්වා දාර්ශනිකයන්ගේ දර්ශනයන් පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් සිදු කිරීමට අපේක්ෂිතය.

### සාහිත්‍ය විමර්ශනය

ඒ. ඩී. පී. කලංසූරිය රචිත නූතන බටහිර දර්ශනය කෘතිය මෙහිදී සුවිශේෂී වශයෙන් භාවිත කෙරේ. මධ්‍යතන දර්ශනයෙන් පසුව නූතන දර්ශනය බිහි වූ ආකාරය හා නූතන දර්ශනය නියෝජනය කරන දාර්ශනිකයන් පිළිබඳව වෙන වෙනම කරුණු දක්වාලීමක් සිදුකර ඇත. එහෙත් නූතන දර්ශනයෙහි අවසන් දාර්ශනිකයා පිළිබඳව ඇති ව්‍යාකූලතාව සම්බන්ධයෙන් කරුණු විග්‍රහයක් මෙහිදී සිදුව නොමැත. හෝමාගම ධම්මානන්ද හිමි රචිත බෞද්ධ විශ්ලේෂී දර්ශනය යන කෘතියෙහි කාල් මාක්ස් නූතන දර්ශනය නියෝජනය කරන්නෙකු ලෙස දක්වා තිබේ. එබැවින් මේ පිළිබඳව යම් ව්‍යාකූල බවක් ඇති බැවින් ඒ පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් සිදු කරනු ලැබේ. නූතන දර්ශනය නියෝජනය කරන හේගල් දක්වා වූ දාර්ශනිකයන් පිළිබඳව විස්තරාත්මක කරුණු පැහැදිලි කිරීමක් ද මෙම කෘතියෙහි අන්තර්ගතය. Bertrand Russell රචිත A History Of Western Philosophy යන කෘතිය බටහිර දර්ශනය සම්බන්ධයෙන් විමසීමේදී වැදගත් වේ. බටහිර

දර්ශනය නියෝජනය කරන යුරෝපීය මෑත දාර්ශනිකයෙකු වශයෙන් කාල් මාක්ස්ව හඳුන්වා ඇත. එසේම සමකාලීන දර්ශනය දක්වා වූ බොහෝ දාර්ශනිකයන් පිළිබඳව පැහැදිලි කිරීමක් මෙහිදී සිදුකර ඇත. කුලසේන විදානගමගේ රචිත දාර්ශනික ගැටලු කෘතියෙහි බුද්ධිවාදය හා අනුභූතිවාදය වෙන් වශයෙන් හඳුන්වා තිබේ. එසේම කතුවරයා හේගල් හා කාන්ට් නූතන දර්ශනයෙහි අවසන් දාර්ශනිකයන් වශයෙන් හඳුන්වා ඇත. නූතන යුගයෙහි දාර්ශනිකයන් පිළිබඳව හඳුනා ගැනීමේදී මෙම කෘතිය උපයෝගී වේ. මීට අමතරව අභ්‍යන්තරයෙහි දක්වා ඇති වෙනත් මූලාශ්‍ර ද උපයෝගී කරමින් මෙම පර්යේෂණය සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

### පර්යේෂණ ගැටලුව

බටහිර දර්ශනයෙහි සුවිශේෂී අවධියක් වශයෙන් හඳුනාගත හැකි නූතන දර්ශනයෙහි ස්වභාවය හා ස්ථානගත වීම කුමනාකාරයෙන් හඳුනාගත හැකිද?

### පර්යේෂණ අරමුණ

නූතන දර්ශනයෙහි ස්වභාවය හා දාර්ශනික අදහස්වල පවත්නා විවිධත්වය හඳුනාගැනීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වේ.

### පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයෙහි එන සන්ධාර විශ්ලේෂණ ක්‍රමවේදය මෙහිදී භාවිත කෙරේ.

### පර්යේෂණයේ වැදගත්කම

බටහිර දර්ශනයෙහි තුන්වන අවධිය පිළිබඳ ක්‍රමානුකූල හා විධිමත් දැනුමක් බිහි කිරීම, කාල නිර්ණය පිළිබඳව පවත්නා ගැටලුව නිරාකරණය කිරීම වැනි වැදගත්කම්වලින් යුක්ත වේ.

**අන්තර්ගතය**

බටහිර දර්ශනයෙහි ක්‍රමික ව්‍යාප්තිය අවධි (යුග) හතරක් ඔස්සේ හඳුනාගත හැකිය. නූතන දර්ශනය (Modern Philosophy) යනුවෙන් හැඳින්වෙනුයේ එහි තුන්වන අවධියයි. නූතන දර්ශනය බිහි වීමෙහිලා පදනම මධ්‍යතන දර්ශනයෙහි පැවති හිඩැස හෙවත් අඳුරු බවයි. බටහිර දර්ශන ඉතිහාසය දෙස අවධානය යොමු කරන කල්හි මධ්‍යතන දර්ශනය අඳුරු යුගයක් (Dark perioud) වශයෙන් හැඳින් වේ. දාර්ශනික වශයෙන් සැලකිය යුතු වර්ධනයක් නොවූ මධ්‍යතන අවධිය ආදානග්‍රාහීත්වය (Dogmatic) පරම දර්ශනය වශයෙන් භාවිත කළ බව පෙනේ. යමක් පිළිගැනීමට නම් විශ්වාස කරන්න යන පදනම බිඳ දමමින් අවිශ්වාසය හෙවත් සැකය (සංශය) යන්න මූලික පදනම වශයෙන් ගෙන නව මාවත් සොයායෑමේ බුද්ධිමය ක්‍රියාවලිය පහලොස්වන සියවසේ අග භාගයේ හා දහසය වන සියවසේ මුල භාගයේ  ඇති විය. නූතන දර්ශනයෙහි ආරම්භය වනුයේ එයයි. රෙනේ ඩේකාට්ස් නූතන දර්ශනයෙහි පියා වශයෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලැබුව ද ඔහුට පෙරාතුව නූතන දර්ශනය බිහි කිරීමට අවශ්‍ය පදනම විවිධ මැදිහත්වීම්වලින් සිදුව ඇති බව කරුණු අධ්‍යයනයෙන් පැහැදිලි වේ. එම පදනම පිළිබඳ කරුණු අධ්‍යයනයට පූර්වයෙන් නූතන දර්ශනයෙහි ආරම්භය හා අවසානය සම්බන්ධයෙන් ඇති විවිධ මත නිරවුල් කළ යුතු වේ. සාමාන්‍යයෙන් නූතන දර්ශනය ආරම්භ කිරීමෙහිලා දැක් වූ දායකත්වයට වඩා දර්ශන විෂයට දැක් වූ දායකත්වය සලකා රෙනේ ඩේකාට්ස් (Rene descartes) නූතන දර්ශනයෙහි පියා වශයෙන් නම් කොට ඇත (ඉදිරියේ විස්තර වේ).

නූතන බටහිර දර්ශනයෙහි අවසාන දාර්ශනිකයා සම්බන්ධයෙන් ඒකමතිකත්වයක් නොමැත. ඇතැම් තැනෙක කාල් මාක්ස් අවසන් දාර්ශනිකයා සේ දක්වා ඇත (ධම්මානන්ද හිමි, 2021, 52). එසේම ඇතැම් කෘතීන්හි විට්ගන්ස්ටෛන් ද නූතන දාර්ශනිකයෙකු සේ හඳුන්වා ඇත (Roger Scruton, 1995). ඒ.ඩී.පී. කලංසූරිය රචිත නූතන බටහිර දර්ශනය කෘතියෙහි ද අවසන් දාර්ශනිකයා ලෙස යොදා ඇත්තේ හේගල්ය (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 321-344). එසේම දාර්ශනික විමර්ශන කෘතියෙහි ද නූතන යුගයේ අවසාන දාර්ශනිකයා වශයෙන් හඳුන්වා ඇත්තේ හේගල්ය (එදිරිසිංහ දයා සහ ඥානදාස පෙරේරා, 2001, 12). ඒ අනුව නූතන දර්ශනයෙහි අවසානය සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයක් පවතින බව පැහැදිලි වේ.

දර්ශනයෙහි අවධි (යුග) වර්ග කිරීමේදී කාල චක්‍රයට ප්‍රමුඛතාවක් ලබා නොදී දාර්ශනික සංදර්භයට ප්‍රමුඛතාවක් ලබා දීම හේතුවෙන් එබඳු ව්‍යාකූලතා හටගෙන ඇති බව ගම්‍ය කළ හැකිය. දාර්ශනික වශයෙන් නව අවධියක් බිහිවනුයේ පවත්නා අවධිය පරිපූරකයක් වශයෙන් සමාජයට අදාළ කල නොහැකි අවස්ථාවක හෝ කැපීපෙනෙන නව සංකල්පයක් චිත්තාකර්ෂණව බිහි වීම හේතුවෙන් යැයි සිතිය හැකිය. එහිදී සමකාලීන දර්ශනය දෙස අවධානය යොමු කිරීමේ දී බට්‍රන්ඩ් රසල් පදනම දමන ලද විට්ගන්ස්ටෛන් විසින් තහවුරු කරණ ලද විශ්ලේෂී දර්ශනය ගත්කළ එය බිහි වීමට හේතු භූත වනුයේ විඥානවාදී ආධිපත්‍යයි. ඔලුවෙන් සිටගත් හේගල් කකුල් දෙකෙන් සිටුවා තබන ලද්දේ මාක්ස් විසිනි. (විදානගම, දාර්ශනික ගැටලු, 2007, 68). ඒ අනුව හේගේලියානු විඥානවාදී අදහස් සමාජයට කෙතරම් බලපෑමක් කර ඇත්ද යන්න විමසිය යුත්තකි. ඒ අනුව සලකන කළ හේගල් නූතන දර්ශනයෙහි අවසන් දාර්ශනිකයා යැයි යොදන ලද කලංසූරිය මතය නිවැරදියැ'යි හැඟේ. එසේම කුලසේන විදානගමගේ සඳහන් කරනුයේ සමකාලීන දාර්ශනික සම්ප්‍රදායන් ගොඩ නැගීම සඳහා අවශ්‍ය පදනම හේගල් විසින් දරන ලද බවයි. හේගේලියානු දර්ශනයෙහි පැවති අපැහැදිලිතාවයන් හා ඇතැම් නොගැලපීම් එයට හේතු වී තිබේ (විදානගම, දාර්ශනික ගැටලු, 2007, 50).

කාල් මාක්ස් 1818දී උපත ලබා පසුකාලීනව සිය දර්ශනය ඉදිරිපත් කරන්නට විය. මාක්ස් ජීවත්ව සිටි අවධියේදී ඔහුගේ දර්ශනයට හිමිවිය යුතු වටිනාකම නොලැබුණු බව කරුණු අධ්‍යයනයෙන් පෙනේ. එසේ නියමිත වටිනාකම ලැබුනේ නම් මාක්ස් සිය අවසන් අවධිය දුක්බරව නොගෙවිය යුතු වේ. එහෙත් මාක්ස්ගේ දර්ශනය එංගල්ස්, ලෙනින්, ග්‍රාම්ස්චි ආදීන් විසින් මාක්ස්වාදයක් වශයෙන් ව්‍යාප්ත කිරීම මාක්ස්ගේ ඉගැන්වීම් ජනප්‍රිය වීමට හේතුවිය. ඒ අනුව මාක්ස්ගේ ඉගැන්වීම් මාක්ස්වාදයක් වශයෙන් ජනප්‍රිය හා ව්‍යාප්ත වීම සිදුවූයේ නිශ්චිත වශයෙන් සමකාලීන අවධියෙහිය. සමකාලීන දර්ශනයෙහි ආරම්භකයා වශයෙන් හැඳින්වෙන බට්‍රන්ඩ් රසල්ට පූර්වයෙන් මාක්ස් සිය ඉගැන්වීම් සිදුකර ඇත. ඒ අනුව නූතන දර්ශනයෙහි අවසානයත් සමකාලීන දර්ශනයෙහි ආරම්භයත් යන අතරමැදි කාලයෙහි මාක්ස් සිය දර්ශනය ඉදිරිපත් කර ඇති බව කාල භේදයට අනුව පෙන්වා

දිය හැකිය. එබැවින් මෙම අධ්‍යයනයේ ද හේගල් නූතන දර්ශනයෙහි අවසන් දාර්ශනිකයා වශයෙන් යෙදීම යුක්ති යුක්ත යැයි හැඟේ. ඩේකාට්ගේ සිට හේගල් දක්වා වූ දර්ශනය නූතන දර්ශනය ලෙස මෙම අධ්‍යයනයේ දී හඳුන්වනු ලැබේ. එහෙත් නූතන දර්ශනය තවමත් අවසන් නොවූ ව්‍යාපෘතියක් බවට ද මතයක් වෙයි. නූතන දර්ශනය බිහි කිරීමෙහිලා පදනම දමන ලද දාර්ශනිකයෝ හා චින්තකයෝ වෙති. පහළොස්වන සියවසෙහි වර්ධනය වූ පුනරුත්ථානය හා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය නූතන දර්ශනයෙහි ආරම්භය සනිටුහන් කරයි. විද්‍යාත්මක සොයා ගැනීම් එහි ප්‍රධාන කාර්යභාරයක් සිදුකළ ද දේශපාලනික හා ආගමික ප්‍රතිසංස්කරණ ද ඒ සඳහා ප්‍රබල බලපෑමක් සිදුකොට ඇති බව පැහැදිලි වේ. ඒ සඳහා ප්‍රධාන දායකත්වයක් දැක් වූ දාර්ශනිකයන් හා චින්තකයන් කිහිප දෙනෙකු පහත දැක් වේ.

ඉරාමුස් (ක්‍රි.ව.1466-1536)

මාටින් ලූතර් (ක්‍රි.ව.1483-1546)

නිකලස් කොපනිකස් (ක්‍රි.ව.1473-1543)

බෲනෝ (ක්‍රි.ව.1548-1600)

රොජර් බේකන් (ක්‍රි.ව.1214-1294)

ගැලීලියෝ ගැලීලි (ක්‍රි.ව.1564-1642)

විලියම් හාවි (ක්‍රි.ව.1578-1657)

ෆ්‍රැන්සිස් බේකන් (ක්‍රි.ව.1561-1626)

ජොහැන්ස් කෙප්ලර් (ක්‍රි.ව.1571-1630)

රෙනේ ඩේකාට් (ක්‍රි.ව.1596-1650) (කලන්සූරිය, දර්ශනය හැඳින්වීමක්, 2002, 47)

මොවුනතරෙන් විද්‍යාත්මක විප්ලවයෙහි කැපීපෙනෙන සාධකය වනුයේ කොපනිකස්ය. එතෙක් පල්ලිය පිළිගත් මතය වනුයේ පෘථිවිකේන්ද්‍රවාදයයි. පෘථිවිකේන්ද්‍රවාදය ප්‍රතික්ෂේප කරමින්

කොපනිකස් විසින් සූර්යකේන්ද්‍රවාදය ඉදිරිපත් කරණ ලදී. එබැවින් පල්ලියෙහි මතවාදීමය වාද, ක්‍රමයෙන් ප්‍රශ්න කිරීමට පුරුදු වීම එයින් සනිටුහන් විය. කොපනිකස්ගේ වාදය ඉගැන්වීම වළක්වාලමින් පල්ලිය විසින් කොපනිකස්ට බලපෑම් කොට එය තහනම් කළ බව සඳහන් වේ. මෙම අදහසට කෙප්ලර් එකඟ වුවද ඔහුට එම වාදය තහවුරු කිරීමට නොහැකි විය. එහෙත් ගැලීලියෝ විසින් දුරේක්ෂය සොයා ගැනීමත් සමඟ එම වාදය යටපත් කිරීම පහසු නොවීය. ඔහු ජුපිටර් ග්‍රහතාරකාව අවට ආකාශ වස්තු සොයා ගැනීමෙන් පසු කොපනිකස්ගේ උපන්‍යාසය විශ්වාස කළේය. එහෙත් ගැලීලියෝගේ දුරේක්ෂය මායාවක් බව පවසමින් කතෝලික පාදිලිවරු එයින් විශ්වය දෙස බැලීමට මැලි විය. ගැලීලියෝට ද එම මතවාද නුගන්වන ලෙස බලපෑම් කළහ. විද්‍යාවෙහි නැඟීම සටහන් වන විට 1628 දී විලියම් හාවි විසින් ශරීරයේ රුධිර ධාවනය වන ආකාරය සොයා ගන්නා ලදී.

විද්‍යාත්මක පිබිදීමට අමතරව යුරෝපයේ සහ මහා බ්‍රිතාන්‍යයේ සංශයවාදය, මානවීයවාදය, දේශපාලන පිබිදීම් සහ ආගමික පිබිදීම් ඇති වූ බව සඳහන් වේ (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 13). 'Reformation. ප්‍රතිසංස්කරණය යනුවෙන් හැඳින්වෙන ආගමික පිබිදීම මෙහිදී සුවිශේෂී වන්නකි. මාර්ටින් ලූතර්, ජෝන් කැල්වින්, උල්රිච් ස්වින්ග්ලි, ජෝන් නොක්ස් ආදීන් නව පදනමකින් යුතුව ක්‍රිස්තියානි ධර්මයක් යුරෝපයට හඳුන්වා දුන්හ. මෙම නව ක්‍රිස්තියානි ධර්මය රෙපරමාදුව නමින් ද හැඳින් වේ. මීට අතිරේක වශයෙන් දේශපාලන දර්ශනයෙහි ද යම් වර්ධනයක් හුදකලාව සිදු වූ බව පෙනේ. නිකොලො මැකියාවෙලි 'Niccolo Machiavelli ක්‍රි.ව 1469-1527' නම් දේශපාලන දාර්ශනිකයා ඊට නිදසුනකි (https://www.britannica.com/biography/Niccolo-Machiavelli). දේශපාලන දර්ශනයට අදාළව රචනා කොට ඇති 'The Prince' 'කුමාරයා' කෘතිය එහිලා ප්‍රධාන වේ.

මීට අතිරේකව තෝමස් හොබ්ස් 'Thomas Hobbes, 1588–1679' දේශපාලන දර්ශනය සම්බන්ධයෙන් ලෙවියාතන් 'Leviathan' කෘතිය රචනා කරමින් සුවිශේෂී දායකත්වයක් දක්වා ඇත (https://plato.stanford.edu/entries/hobbes-moral/). නවීන උද්ගාමී ක්‍රමයෙහි ආරම්භකයා වශයෙන් හඳුනාගත හැකි ප්‍රැන්සිස් බේකන්

'Francis Bacon, 1561-1626. ද නූතන දාර්ශනිකයෙකු සේ පෙන්වා දී තිබේ (RUSSELL, 1945, 540). විද්‍යාත්මක න්‍යාය මත මොහුගේ වාදය පැසසිය යුතු වුවද දාර්ශනික කරුණු වශයෙන් අසතුටු වන බව රසල් දක්වා තිබේ. මේ ආකාරයට නූතන දර්ශනයෙහි ආරම්භය සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කළ හැකිය. නූතන බටහිර දර්ශනයෙහි පියා ඩේකාට් වුවද ඔහුට පූර්වයෙන් මධ්‍යතන දර්ශනයෙන් විතැන් වීම උදෙසා නව ප්‍රවේශයන් ඉදිරිපත්ව පැවති බව මෙමඟින් ගම්‍ය කළ හැකිය. නමුත් ඩේකාට් ඉදිරිපත් කරන ලද දර්ශනය එතෙක් පිළිගත් විශ්වාසය යන විධික්‍රමය ප්‍රශ්නයට නගමින් සියල්ල සංශයවාදයට යටත් කළ යුතු බව දක්වන්නට විය. එබැවින් එය චින්තනයෙහි හැරවුම් ලක්ෂයකි. නමුත් ඩේකාට්ගේ දාර්ශනික අදහස් ස්වතන්ත්‍රව බිහි වූවක් ලෙස හඳුනාගත නොහැකිය. පූර්වයෙන් දැක් වූ දාර්ශනික අදහස්වල ප්‍රතිඵලයක් ලෙස ඩේකාට්ගේ දර්ශනය බිහි වීම ඊට හේතුවයි. එහෙත් විලියම් හාවි, ගැලීලියෝ ගැලීලි වැනි විද්‍යාඥයන්ගේ ආභාසය ඍජුව වැළඳගැනීමට ඩේකාට් පසුබට වී ඇත. පල්ලිය සතුව පැවති අභියෝගයට ලක් කිරීමට අපහසු බලාධිපත්‍ය ඊට හේතුවයි. ඒ අනුව රෙනේ ඩේකාට්ගේ සිට හේගල් දක්වා වූ ප්‍රධාන දාර්ශනිකයන්ගේ දර්ශන සම්බන්ධයෙන් මෙතැන් සිට අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

- රෙනේ ඩේකාට් - René Descartes (ක්‍රි.ව.1596-1650)
- බෙනඩික්ට් ස්පිනෝසා - Benedictus Spinoza (ක්‍රි.ව.1632-1677)
- විල්හෙල්ම් ගොට්ෆ්‍රීඩ් ලයිබ්නිස් - Gottfried Wilhelm Leibniz (ක්‍රි.ව.1646-1716)
- ජෝන් ලොක් John Locke - (ක්‍රි.ව.1632-1704)
- ජොර්ජ් බර්ක්ලේ - George Berkeley (ක්‍රි.ව.1685-1753)
- ඩේවිඩ් හ්‍යුම් - Devid Hume (ක්‍රි.ව.1711-1776)

- ඉමානුවෙල් කාන්ට් - Immanuel Kant (ක්‍රි.ව.1724-1804)
- ජෝර්ජ් හේගල් - Georg Wilhelm Friedrich Hegel (ක්‍රි.ව.1770-1831)

මේ ආකාරයට හඳුනාගත හැකි නූතන දාර්ශනිකයන් අංශ කිහිපයක් ආවරණය වන සේ සිය දැනුම ව්‍යාප්ත කොට ඇත. දර්ශන විෂයෙහි සාකච්ඡා වන ඥානවිභාගවාදය, අධිභෞතික විද්‍යාව, ආචාරවිද්‍යාව ආදී නොයෙක් අංශ ඉන් ආවරණය වේ. සමස්තයක් වශයෙන් නූතන දර්ශනයෙහි දාර්ශනික සංකල්ප ප්‍රධාන කොටස් ත්‍රිත්වයකට බෙදා වෙන්කළ හැකිය.

බුද්ධිවාදය - Rationalism

අනුභූතිවාදය - Empiricism

විඥානවාදය - Idealism

**බුද්ධිවාදය**

බුද්ධිවාදී ගුරුකුලය මූලාකෘතිවාදීන් යනුවෙන් ද අනුභූතිවාදී ගුරුකුලය බාහිරාකෘතිවාදීන් වශයෙන් ද හඳුන්වා දී තිබේ (ධම්මානන්ද හිමි, 2021, 52). රෙනේ ඩේකාට්, බෙනඩික්ට් ස්පිනෝසා, විල්හෙල්ම් ගොට්ෆ්‍රීඩ් ලයිබ්නිස් ආදී බ්‍රිතාන්‍ය දාර්ශනිකයන් බුද්ධිවාදීන් ලෙස හඳුන්වනු ලැබේ. බුද්ධිය ඇසුරෙන් සියලු ඥානයන් බිහිවෙන බව බුද්ධිවාදීහු දක්වති. 'The belief that all behaviour, opinions, etc. should be based on reason rather than on emotions or religious beliefs' (https://www.oxfordlearnersdictionaries.com/definition/english/rationalism?q=rationalism) ආගමික විශ්වාස හෝ හැඟීම් මත පදනම් වනවා වෙනුවට තර්කය හෙවත් බුද්ධිය මත පදනම් වන න්‍යාය බුද්ධිවාදය වන බව ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයෙහි දැක්වේ.

ඥානය ලබාගත හැකිවනුයේ බුද්ධිය මඟින් පමණක් බව මොවුහු අවධාරණය කොට තිබේ. පැත්තකට වී නිසොල්මන්ව කල්පනා කිරීමෙන් හා තර්ක කිරීමෙන් ලෝකයේ යථාභූතය පිළිබඳව අවබෝධය ලැබිය හැකි බව දක්වා ඇත (ධර්මසිරි, 2007,

13). බුද්ධිය මත පදනම්ව ඥානය ලබා ගැනීමේදී කරුණු කිහිපයක් ප්‍රතික්ෂේප වේ. අත්දැකීම්, දිව්‍යමය පිළිගැනීම්, ආයතන මත පදනම් වූ අධිකාරීත්වය (https://www.rep.routledge.com/articles/thematic/rationalism/1) යනාදියයි. මෙමගින් මූලික වශයෙන් කතෝලික පල්ලි සංස්ථාව සතු අධිකාරීත්වය බිඳ වැටී පුද්ගල බුද්ධියට ප්‍රමුඛතාවක් ලබාදීම සිදු වේ. එහෙත් ඇතැම් බුද්ධිවාදී දාර්ශනිකයන්ට සිය පූර්ව දේවවාදී ආභාෂයෙන් විතැන් වීමට නොහැකි වී ඇත. ඒ බැව් බුද්ධිවාදී දාර්ශනිකයන් තිදෙනා සම්බන්ධයෙන් කරනු ලබන අධ්‍යයනයෙන් මනාව තහවුරු කළ හැකි වේ.

**රෙනේ ඩේකාට්**

ප්ලේච්හි ජෙසුයිට් විද්‍යාලයට ඇතුළු වී අධ්‍යයන කටයුතු සිදු කළ ඩේකාට් පැරණි භාෂා, තර්ක ශාස්ත්‍රය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, ආචාර ධර්ම, අධිභෞතිකවාදය වැනි ක්ෂේත්‍ර ඔස්සේ දැනුම වර්ධනය කොට තිබේ. මොහු විසින් රචිත කෘති අතර 'රීතියේ දේශනාව, භාවනාව, දර්ශනයේ ධර්මතා' යන කෘති ප්‍රධාන වේ. ඩේකාට්ගේ දර්ශනය පිළිබඳව අවබෝධයෙන් අධ්‍යයනය කළ විට මොහු සැබවින්ම මධ්‍යතන පල්ලිය කේන්ද්‍ර කරගත් දර්ශනයෙන් මිදුනේ ද යන්න පිළිබඳව ප්‍රශ්නාර්ථයක් මතුවනු ඇත. ඊට හේතු වනුයේ ඩේකාට් නවතම දර්ශනයක් ඉදිරිපත් කළ ද සැබවින්ම පල්ලිය කේන්ද්‍ර කරගත් දර්ශනයෙන් මිදීමට අපොහසත් වීමය.

ඩේකාට් මන්තාහමස්මි හෙවත් කෝජිටෝ තර්කය 'මම සිතමි එමනිසා මම පවතිමි' (I think, therefore I am) උපයෝගී කරගනමින් සිය බුද්ධිවාදී පදනම ඉදිරිපත් කරනු ලබයි (Weitch, 1907, 105) මොහු සංශය හෙවත් සැකය (Doubt) විධික්‍රමය වශයෙන් භාවිත කොට ඇත. ඒ අනුව දෙවියන් වහන්සේගේ පටන් සියල්ල සැකකළ පසු සැක නොකළ හැකි තත්වයක් හමු වේ. එනම් තමා සිතන මොහොතේ පැවැත්මයි. සමස්ත ලෝකය පිළිබඳව සැක කරණ කල්හි එම මොහොත/අවස්ථාව සැකයෙන් තොර වන බව මොහුගේ අදහසයි (Cogito ergo sum). එහෙත් ඩේකාට්ගේ මෙම බුද්ධිමය එළඹුම නැවත ආපස්සට තල්ලු කිරීමක් ඔහු විසින්ම සිදු කොට ඇත. එයට හේතුව වනුයේ සැක නොකළ හැකි කිසිවක් ඇද්ද යන්න නැවත සිතීමට ඩේකාට් පෙළඹීමයි. එම පෙළඹවීමෙන් කරුණු තුනක් මොහු ගම්‍ය කරයි.

- තමාගේ පැවත්ම
- බාහිර ලෝකයේ පැවත්ම
- දෙවියන් වහන්සේගේ පැවත්ම

මෙම පෙළඹවීමෙන් පසුව ඩේකාට් ස්වයං විසංවාදී (self contradictory) ප්‍රස්තුතයක් ඉදිරිපත් කොට ඇති බව හඳුනාගත හැකිය. නැවත දෙවියන්ට සමීප වීම යනු එතෙක් පිළිගත් මතවාදය වක්‍රව පිළිගැනීමයි. එහෙත් බුද්ධිමය ක්‍රියාවලියක් මඟින් සිය අරමුණ සාක්ෂාත් කොට ඇති බව අමතක නොකළ යුතුය. ඩේකාට් මෙයින් අපේක්ෂා කර ඇත්තේ ශක්තිමත් පදනමකින් යුතුව දර්ශනය ගොඩ නැගීම බව 'මාගේ අරමුණ ස්ථිර පදනමක් සෙවීමය. එවිට පස් හා වැලි ඉවත දමා විශ්වාසීය හා ශක්තිමත් පදනමක් ලැබෙනු ඇත' (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 21) යන්නෙන් පැහැදිලි වේ. නියත දර්ශනයකට අවශ්‍ය රීති කිහිපයක් ඔහු පහත පරිදි පෙන්වා දී ඇත.

- ඉතාමත් පැහැදිලි ලෙස නොදන්නේ නම් කිසිවක් සත්‍ය ලෙස පිළි නොගැනීම
- සියලු දේ කුඩාම ඒකකය දක්වා බෙදා දැක්වීම හෙවත් විභජනය කිරීම
- ඉතා සරල දෙයින් ආරම්භ කොට සංකීර්ණ දේ කරා ගමන් කිරීම
- කිසිම අංශයක් අත් නොහැර සඳහන් කිරීම (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 17)

ඩේකාට්ගේ දර්ශනයෙහි කාය-චිත්ත ගැටලුව සම්බන්ධයෙන් ද්වෛතවාදය (Dualism) යනුවෙන් සාකච්ඡාවට ලක්කොට ඇත. ඩේකාට්ට අනුව කය හා මනස වෙනම ක්‍රියාත්මක වේ. ඒ අනුව කය එක වස්තුවක් වන අතර මනස තවත් වස්තුවක් වේ. මෙය වෙන් වෙන්ව ස්වෛරීව ක්‍රියා කරන වස්තු දෙකක් ලෙස ඩේකාට් පිළිගෙන තිබුණි. කයෙහි පැවැත්මට ආහාර, ජලය වැනි දෑ ද සිතෙහි පැවැත්මට

මතකයේ සිතුවිලි වැනි දෑ ද ආහාරයට ගන්නා බව ඩේකාට් දක්වා තිබේ. සිත එකවර එක තැනක පැවතුන ද සිතට ක්‍ෂණයෙන් තමන් දන්නා විශ්වයේ ඕනෑම තැනකට ගොස් නැවත පැමිණීමට හැකියාව තිබේ. කයෙහි පැවැත්මට මනසේ පැවැත්ම අවශ්‍ය නොවන අතර මනසේ පැවැත්මට කයෙහි පැවැත්ම අවශ්‍ය නොවන බව ඩේකාට් සඳහන් කරයි. ඩේකාට් නම් දාර්ශනිකයා නූතන දර්ශනයේ හැරවුම් ලක්‍ෂයක් වුවද පරිපූර්ණ වශයෙන් මධ්‍යතන දාර්ශනික ආභාසයෙන් වියුක්ත වීමට අපොහසත් වී ඇති බව කරුණු අධ්‍යයනයෙන් පෙනේ. ඊට ප්‍රධාන හේතුව ක්‍රිස්තියානි පල්ලිය සතු අධිකාරීත්වයයි.

**බෙනඩික්ට් ස්පිනෝසා**

17 වන සියවසේ ප්‍රධාන දාර්ශනවාදියා ලෙස සම්භාවනාවට ලක් වී ඇති ස්පිනෝසා Baruch (de) Spinoza පෙර දැක් වූ බෙනඩික්ට් යන්නට අමතරව මෙනමින් ද හැඳින්වේ. ප්‍රංශ, ජර්මන්, ස්පාඤ්ඤ, ඉතාලියානු, ඕලන්ද, පෘතුගීසි, ලතින්, ග්‍රීක ආදි භාෂා කිහිපයක් කතා කිරීමේ ශක්‍යතාවයක් ස්පිනෝසාට තිබූ බව සඳහන් වේ. ඩේකාට්ගේ බලපෑම හැරුණ විට භාෂා හැකියාව ද ස්පිනෝසාගේ දර්ශනයට හේතු වූ බව සිතිය හැකිය. යුදෙව්වකු වූ මොහු යුදෙව් පූජකවරුන් විසින් යුදෙව් ආගමෙන් නෙරපූ බව සඳහන් වේ. ඊට හේතුව වනුයේ පල්ලියෙහි මතවාද පිළි නොගැනීමයි. ස්පිනෝසා රචිත ග්‍රන්ථ අතර 'එතික්ස්' කෘතිය සුවිශේෂී වේ. ආචාරධර්ම, ආගමික දර්ශනය, භෞතික විද්‍යාව, ඥානවිභාගය, මනෝවිද්‍යාව ආදී ක්ෂේත්‍ර කිහිපයකට අයත් තේමා එහි අන්තර්ගත කොට තිබේ. ඊට අමතරව ට්‍රැක්ටේටස් තියෝලොජිකො පොලිටික්ස් නමැති ආගමික හා දේශපාලන අදහස් අඩංගු සංග්‍රහය ද ස්පිනෝසා රචිත කෘතියකි.

ස්පිනෝසාගේ බුද්ධිවාදී චින්තනයට මූලික පදනම ගණිතයෙන් ලැබී ඇත. ගණිතමය රීතිය යොදා ගනිමින් නිර්වචන, ස්වසිද්ධීන්, ප්‍රස්තුත, ප්‍රමේයයන්, සාධනයන් හා උපප්‍රමේයන් මාර්ග කරගත් විට සත්‍ය හා ඥානය ලබාගත හැකි බව මොහු අවධාරණය කොට තිබේ. ඩේකාට් බුද්ධිවාදී පදනම සඳහා ගණිතමය රීතිය යොදාගත්ත ද ස්පිනෝසා ඉන් ඉදිරියට ගොස් ගණිතමය නිර්වචන, ස්වසිද්ධීන් හා ප්‍රස්තුත යනාදිය ද සත්‍ය හා ඥානය ලබා ගැනීමේ දී යොදාගෙන

තිබේ. ඩේකාට්ට අනුව ගණිතයෙහි ඇත්තේ පැහැදිලි රීතියකි. එහි සියල්ල පැහැදිලි හා සත්‍ය ලෙස පිළිගත් මොහු දර්ශනය ද එසේ ගෙනහැර දැක්විය යුතු බව දක්වා ඇත. (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 45). මෙහිදී ආනුභූතික සත්‍යෙක්ෂණය මත පදනම් නොවී තාර්කික බව මත පදනම් වී සත්‍ය අනාවරණය කළ යුතු වේ. විශේෂයෙන් සත්‍ය ගවේෂණයේදී හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධතාවය සොයන නිශ්චිත ක්‍රමයෙන් විතැන් වෙමින් තාර්කික රඳා පැවැත්මක් තිබිය යුතු බව මොහු අවධාරණය කොට තිබේ. එය මොහුගේ දර්ශනයෙහි ඇති බුද්ධිමය එළඹුමකි.

ස්පිනෝසා කාටිසියානු ද්වෛතය ප්‍රතික්ෂේප කොට ඒකත්වයකට (Monism) පැමිණ වීමක් සිදුකර ඇත. ස්පිනෝසා දක්වනුයේ විශ්වයෙහි රාමුව දෙවියන් වන බවයි. එම භෞතික රාමුවෙහි මානසික අංශය දෙවියන්ගේ මනස වේ. ඒ අනුව සොබා දහම යනුවෙන් අර්ථකථනය කොට ඇත්තේ දෙවියන් වහන්සේය. එහෙත් එම දෙවියන් සාමාන්‍යයෙන් යුදෙව් හෝ වෙනත් ආගමක එන දෙවියන් නොවීම එහි විශේෂත්වයයි. එහෙත් ස්පිනෝසා මෙය ආගමික සංකල්පයක් ලෙස දක්වන්නේ නැත. මොහු සොබා දහම හා සම්බන්ධයෙන් දක්වනුයේ සොබා දහමට කිසිඳු බියකින්, භක්තියකින්, ගෞරවයකින් තොරව කටයුතු කළ යුතු බවයි. එහිදී සොබා දහම නිසි ලෙස අවබෝධ කළ යුතු බව ඔහු අවධාරණය කර ඇත. ස්පිනෝසාට අනුව සොබා දහම හා දෙවියන් වහන්සේ එකම කාසියේ දෙපැත්තකි.

මොහුගේ ආචාර විද්‍යාත්මක සංකල්ප දෙස විමසීමේ දී පෙනී යන්නේ ප්‍රායෝගික ආචාරධර්මීය විග්‍රහයක් සිදුකොට ඇති බවයි. පැවති ආගම් විවේචනයට පාත්‍ර කළ ස්පිනෝසා දක්වනුයේ ආගමෙන් තොර සදාචාරයක් පවත්නා බවයි. එහි ප්‍රායෝගිකව සහ සක්‍රීයව යෙදීමෙන් ආගමෙහි උගන්වන්නා වූ විමුක්තිය මෙන් පරම නිදහසක් කරා ළඟාවීමට පුද්ගලයාට හැකි බව පෙන්වා දෙයි. පුද්ගලයා කෙලෙසන්නේ, පාපයට යොමු කරන්නේ, සදාචාරයෙන් පිරිහෙලන්නේ අන් කිසිවක් නිසා නොව පුද්ගල අභ්‍යන්තරයේ පවත්නා තෘෂ්ණාව නිසාය. තෘෂ්ණාව මුළුමනින්ම ඉවත් කළ යුතුය. එයම විමුක්තිය වන බව ස්පිනෝසා පෙන්වා දී තිබේ.

## විල්හෙල්ම් ගොට්ෆ්‍රීඩ් ලයිබ්නිස්

බුද්ධිවාදී ගුරුකුලයේ අවසාන දාර්ශනිකයා වනුයේ ලයිබ්නිස්ය. මොහුගේ පියා දර්ශනය පිළිබඳ මහාචාර්යවරයෙකු විය. එබැවින් කුඩාකල සිට දර්ශනය පිළිබඳ රුචිකත්වයක් දක්වන ලදී. 'මොනොඩොලොජි, ස්වභාවය හා දයාව පිළිබඳ ධර්මතා, අධිභෞතික වාදය පිළිබඳ දේශනා, තියොඩිසි' වැනි කෘති මොහු රචනා කොට තිබේ. ලයිබ්නිස්ගේ ප්‍රධාන අරමුණ වනුයේ ''නවීන සොයා ගැනීම් පැරණි ආගමික ආධානග්‍රාහීත්වය සමඟ සංකලනය කර පොදු යමක් නෙලා ගැනීමකි'' (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 63). ඒ අනුව නූතනත්වය කෙරෙහි රුචිකත්වයක් දැක්වූ මොහුගේ අභිලාෂය වනුයේ නූතන හා පැරණි සංකල්ප මුසු කිරීමය. මොහු කුඩා කල සිටම ගැලීලියෝ, කෙප්ලර්, ඩේකාඩ් වැනි යුරෝපියානු දාර්ශනිකයන් හා විද්‍යාඥයන් ලොවට හඳුන්වා දුන් නවතම සංකල්ප කෙරෙහි රුචිකත්වයක් දැක්වීය. එහෙත් එම නවතම විද්‍යාත්මක පිබිදීම පල්ලිය විසින් ප්‍රතික්ෂේප කරන්නට විය. එබැවින් මොහුට එම විද්‍යාත්මක නව සොයාගැනීම් හා ආගමික මතවාදයන් සුසංයෝග කිරීමට අවශ්‍ය විය.

ලයිබ්නිස් සිය බුද්ධිවාදී දාර්ශනික විග්‍රහයේදී ප්‍රස්තුත විග්‍රහ සිදු කරනු ලබයි. ඉන් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයට වඩා පැහැදිලි බව හා නිරවුල් බව පදනම කරගන්නා සහජ සංකල්පවාදයක් ඉදිරිපත් වේ. එහිදී ප්‍රස්තුත යුගලයක් හා නියමයන් යුගලයක් ඉදිරිපත් කරයි. ප්‍රස්තුත යුගලයෙහි සත්‍යාසත්‍ය බව විනිශ්චය කිරීම නියමයන්ගෙන් සිදුකෙරේ. අවශ්‍ය ප්‍රස්තුත - අනිශ්චිත ප්‍රස්තුත.

අවිසංවාදි නියමය - පර්යාප්ත හේතු නියමය (ධම්මානන්ද හිමි, 2021, 63-64).

ඉහත සඳහන් අවශ්‍ය ප්‍රස්තුතයක සත්‍ය අසත්‍යතාව රඳා පවතිනුයේ අවිසංවාදි නියමය මත බව ලයිබ්නිස් දක්වයි. අවශ්‍ය ප්‍රස්තුතයක ස්වභාවය වනුයේ වාචකය වාච්‍ය තුළ අන්තර්ගතව තිබීමයි. නිදසුනක් ලෙස ත්‍රිකෝණයට කෝණ තුනක් ඇත යන්න දැක්විය හැකිය. එහිදී වාචකය තුළ වාච්‍ය අන්තර්ගතව පවති. අවශ්‍ය ප්‍රස්තුතයක සත්‍යාසත්‍ය බව සෙවීමට බාහිර තොරතුරු ලබා ගැනීමක් සිදු නොකෙරේ. අවශ්‍ය ප්‍රස්තුතයක් නිශේධනය කළ විට

විසංවාදයක් හටගනී. එය අවිසංවාදී නියමයෙන් කියැවෙයි. එහෙත් අනිශ්චිත ප්‍රස්තුත විග්‍රහ කිරීමට යොදාගත් පර්යාප්ත හේතු නියමය විග්‍රහ කිරීමේදී ලයිබ්නිස් දක්වනුයේ හේතුවක් නොමැතිව කිසිවක් හටනොගන්නා බවය. එය එලෙස විය හැකිය. ඒ අනුව ලෝකය නමැති ඵලයට ද හේතුවක් තිබිය යුතුය. එසේම සර්වබලධාරී දෙවියන්ට ද හේතුවක් තිබිය යුතුය. ඒ ආශ්‍රයෙන් මොහු අවධාරණය කරනුයේ ලෝකය නමැති ඵලයෙහි හේතුව දෙවියන් වහන්සේ බවයි. එහෙත් දෙවියන් වහන්සේගේ හේතුව කුමක්ද? යන්න මත ගැටලුවක් මතු වේ. එබැවින් ලයිබ්නිස්ගේ එකී මතය තුළ විසංවාදයක් හටගනී.

මීට අමතරව ලයිබ්නිස් තන්මාත්‍ර (Monads) පිළිබඳ සංකල්පයක් උගන්වයි. ඉන් අදහස් කරනුයේ කිසියම් සරල වස්තුවකි. ලයිබ්නිස්ට අනුව ලෝකය නිර්මාණය වී ඇත්තේ තන්මාත්‍ර සමූහයකිනි. තන්මාත්‍ර යනු තවත් දෙයක එකත්වයක් හෝ සංයෝගයක් නොවේ. එය මූල ධාතූන් වේ. මොහුට අනුව ලෝකය තුළ සංකීර්ණ වූ සෑම වස්තු නිර්මාණය වී ඇත්තේ තන්මාත්‍රවලිනි. මෙකී තන්මාත්‍ර ත්‍රිත්වයකි. නග්න තන්මාත්‍ර Bare monads, ආත්ම තන්මාත්‍ර Souls monads, ජීව තන්මාත්‍ර Spirits monads යනුවෙන් හඳින්වෙනුයේ එම තන්මාත්‍රයි.

මෙකී තන්මාත්‍ර සමූහයෙන් ද්‍රව්‍ය නිෂ්පාදනය වන අතර එම තන්මාත්‍ර අවිනාශී වන බව දක්වයි. මෙම තන්මාත්‍ර දෙවියන් වහන්සේගේ නිර්මාණයක් බැවින් එය අවිනාශි බවත් යම් හෙයකින් දෙවියන් වහන්සේට අවශ්‍ය නම් එම තන්මාත්‍ර විනාශ කළ හැකි බව ද ලයිබ්නිස් දක්වා තිබේ. ඒ අනුව මෙතෙක් අධ්‍යයනයට ලක් කළ බුද්ධිවාදී දාර්ශනිකයන් අතුරෙන් ලයිබ්නිස්ගේ බුද්ධිවාදී එළඹුම ඉදිරියෙන් සිටින බව පැහැදිලිය. එහෙත් දෙවියන් වහන්සේගේ නිර්මිතයක් යනුවෙන් පැවසීමෙන් ගම්‍ය වනුයේ නැවත වතාවක් මොහුගේ දර්ශනය මධ්‍යතන යුගයේ මෙන් දෙවියන් සමීපයේ නතර වී ඇති බවයි.

### අනුභූතිවාදය

බුද්ධිවාදී සම්ප්‍රදායට ප්‍රතිපක්ෂව කරුණු දක්වන ලද දාර්ශනික සම්ප්‍රදාය වනුයේ අනුභූතිවාදයයි. අනුභූතිය යනුවෙන් අදහස් කරනුයේ ප්‍රත්‍යක්ෂයට ලක්වෙන හෙවත් අත්දැකීමට ලක්කළ හැකි යන්නය. එනම්

පංචේන්ද්‍රියන්ට ගොදුරුවන යන්නය. යමක් පංචේන්ද්‍රියන්ට විෂය ගෝචර නොවන්නේ නම් එය ඥානයක් විය නොහැකි බව මොවුන්ගේ මතයයි. අධිකාරිය, ශ්‍රැතිය, ආදී ඥාන මාර්ග එයින් ප්‍රතික්ෂේප වේ. ජෝන් ලොක්, ජොර්ජ් බර්ක්ලේ, ඩේවිඩ් හ්‍යුම් යන දාර්ශනිකයෝ එහි ප්‍රධාන වෙති. අනුභූතිවාදී දාර්ශනික අදහස් තෝමස් හොබ්ස්, ප්‍රැන්සිස් බේකන් ආදී දාර්ශනිකයන් ඉදිරිපත් කොට තිබුණ ද පූර්ණ වූ වාදයක් වශයෙන් ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිවනුයේ ජෝන් ලොක්ටය. 'In all its forms, empiricism stresses the fundamental role of experience. As a doctrine in epistemology, it holds that all knowledge is ultimately based on experience (https://www.rep.routledge.com/search?searchString=empiricism&newSearch=). මේ අනුව ඥානවිභාගයේ දී මොවුහු පදනම වශයෙන් ඉදිරිපත් කරනුයේ අත්දැකීමයි. අනුභූතිවාදයෙහි විශේෂත්වය වනුයේ ප්‍රත්‍යක්ෂයට ගොදුරු නොවන සියල්ල ප්‍රතික්ෂේප වීමයි.

**ජෝන් ලොක්**

බ්‍රිතාන්‍ය අනුභූතිවාදියෙකු වන ජෝන් ලොක් ඉංග්‍රීසි ජාතිකයෙකු වේ. අනුභූතිවාදී අදහස්වලට අමතරව ලොක් සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි ඔහුගේ දේශපාලන අදහස් ද වැදගත් වේ. ග්‍රන්ථ කිහිපයක් රචනා කර ඇති ලොක්ගේ ප්‍රධාන කෘතියක් වනුයේ ''මනුෂ්‍ය බුද්ධිය පිළිබඳ රචනාව'' (An Essay Concerning Human Understanding) යන කෘතියයි. ඊට අතිරේකව ලොක්ගේ දේශපාලන අදහස් අන්තර්ගත 'දේශපාලනය, ආගම සහ අධ්‍යාපනය පිළිබඳ නිබන්ධය, ආණ්ඩු ක්‍රම හා සම්බන්ධ විවරණ දෙකක්, යන කෘති ද ආගම සම්බන්ධයෙන් 'ක්‍රිස්තියානියෙහි යුක්ති සහගතභාවය' යන කෘති ද මොහු විසින් රචානා කොට තිබේ. ලොක්ගේ අනුභූතිවාදී අදහස් වර්ධනය වීමට හේතුව වනුයේ බුද්ධිවාදී ඩේකාට් සහ විද්‍යාවේ පැවති අනුභූතිමය ලක්ෂණයයි.

ලොක්ට පූර්වයෙන් සිටි බුද්ධිවාදීහු සහජ සංකල්පවාදය මගින් අනුභූතිය ප්‍රතික්ෂේප කර ඇත. එම එළඹුම දෝෂ සහගත බව හඳුනාගත් ලොක් දක්වන ලද්දේ පුද්ගල දැනුම සහජ සංකල්ප මත බිහි වන්නේ නම් පුද්ගල දැනුමෙහි විවිධතා හා විෂමතා නොපැවතිය යුතු

බවයි (ධම්මානන්ද හිමි, 2021, 63-68). එබැවින් සහජ සංකල්පවාදය ප්‍රතික්ෂේප කරන ලොක් දක්වනුයේ පුද්ගලයා උපතින් පසු අත්දැකීම් මගින් ඥානය ලබා ගන්නා බවයි. ඒ අනුව පුද්ගලයාගේ මනස හිස් පුවරුවක් හා සමාන වේ. පුද්ගලයා සිය සංවේදනයෙන් ලබා ගන්නා වූ අත්දැකීම් මත එම පුවරුවෙහි විවිධ දෑ සටහන් කරනු ලබන බව මොහුගේ අදහසයි. ලොක් 'Tabula rasa' යන යෙදුමෙන් එය පැහැදිලි කොට තිබේ. ඒ අනුව සංකල්පවලින් ශුන්‍ය වූ මනසෙහි ඥානය බිහිවන ආකාරය දක්වාලනුයේ ඉන්ද්‍රියන් අනුසාරයෙනි. ඇස, කන ආදී වූ ඉන්ද්‍රියන් මඟින් ලබාගන්නා වූ සංවේදනයන් ආශ්‍රයෙන් මනස දැනුම ලබාගනී. එහෙත් දැනුම ඉන්ද්‍රියන්ගෙන් තොරව බිහි නොවේ. මෙම කාර්ය සිදු කිරීමේ දී මනසෙහි ඇති සංවේදනය හා ප්‍රත්‍යවේක්ෂණය උපකාරී වන බව ලොක්ගේ මතයයි 'All ideas come from sensation or reflection'. සංවේදනයෙන් ලබන්නා වූ ප්‍රත්‍යක්ෂයමය වස්තුව හෙවත් දැනීම නිශ්චිත දැනුමක් බවට පරිවර්තනය කරනුයේ ප්‍රත්‍යවේක්ෂණයයි.

**ජොර්ජ් බර්ක්ලේ**

බ්‍රිතාන්‍ය අනුභූතිවාදයෙහි දෙවැනි දාර්ශනිකයා ලෙස හඳුනාගත හැකි මොහු Bishop Berkeley යනුවෙන් ද හැඳින් වේ. අනුභූතිවාදියෙකු, කථිකාචාර්යවරයෙකු, ක්‍රිස්තියානි පාදිලිවරයෙකු, බිෂොප්වරයෙකු, තානාපතිවරයෙකු වශයෙන් විවිධ තනතුරු දරණ ලද බර්ක්ලේ වඩාත් ප්‍රසිද්ධ වනුයේ අනුභූතිවාදී දාර්ශනිකයෙකු වශයෙනි. 'දෘෂ්ටිය පිළිබඳ නව සිද්ධාන්තයක් A new theory of vision, මනුෂ්‍ය ඥානය සම්බන්ධ මූල ධර්ම The principles of Human knowledge, හයිලාස් සහ ප්ලෝනුවස් අතර දෙබස් The Dialogues of Hylas and Philonous, o fudgq De Motu, විභජ්‍යවාදියා The Analyst, සිරිස් සීරසි' ආදී කෘති කිහිපයක් රචනා කර ඇති බර්ක්ලේ පූර්වයෙන් සිටි ලොක්ගේ දර්ශනයෙහි ඇති ගැටලු හෙවත් විසංවාදයන් මග හරවා ගනිමින් අනුභූතිවාදය ඉදිරියට ගෙනගිය බව සඳහන් වේ (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 161). එහෙත් බර්ක්ලේගේ දර්ශනයෙහි අවසානය දෙස නැවත බලන විට ගම්‍ය වනුයේ ඔහුගේ දර්ශනය විඥානවාදයක් කරා ගමන් කර ඇති බවය.

බර්ක්ලේගේ දර්ශනයෙහි ඇති විශේෂත්වය වනුයේ ප්‍රත්‍යක්ෂයෙන් තොර සියල්ල ප්‍රතික්ෂේප වීමයි. මෙය අනුභූතිවාදයෙහි කැපී පෙනෙන සංවර්ධනයක් ලෙස පෙන්වා දිය හැකිය. බර්ක්ලේ දක්වනුයේ ද්‍රව්‍ය කිසිවක් ප්‍රත්‍යක්ෂ නොකරන බවයි. ප්‍රත්‍යක්ෂ කරනුයේ ලක්ෂණයන්ය (ධර්මසිරි, 2007) 20). ඒ අනුව යමක් පවතිනුයේ මනස මගින් ප්‍රත්‍යක්ෂ කරන්නේ නම් පමණි. මනස මගින් ප්‍රත්‍යක්ෂ නොකරණ කල්හි බාහිර වස්තු නොපවතින්නේ ද? යන ගැටලුව ඉන් අනතුරුව හටගනී. එයට බර්ක්ලේ සඳහන් කරනුයේ මා මනසින් ප්‍රත්‍යක්ෂ නොකරණ කල්හි අන් කෙනෙකු විසින් ප්‍රත්‍යක්ෂ කරන බැවින් එය පවතින බවයි. එවිට තවත් ගැටලුවක් මතු වේ. තමා ද අන් අයකු ද ප්‍රත්‍යක්ෂ නොකරණ කල්හි බාහිර වස්තු පවතීද යන්නය. එවිට බර්ක්ලේ සඳහන් කරනුයේ දක්වනුයේ සර්වබලධාරී දෙවියන් වහන්සේ විසින් සියලු කල්හි සෑම දේම ප්‍රත්‍යක්ෂ කරන බැවින් බාහිර ලොව පවතින බවයි.

"මට ප්‍රත්‍යක්ෂ නොවන විට හෝ මගේ මනසෙහි නොපවතින විට හෝ සදාකාලික දෙවියන්ගේ මනසෙහි නොපවතින විට හෝ යමකට කිසිම පැවැත්මක් නොමැත." දෙවියන් වහන්සේගේ ප්‍රත්‍යක්ෂයෙන් විතැන් වූ විට බාහිර වස්තු නොපවතී. තාර්කික වශයෙන් හා තමා අනුගමනය කරන ආයතය වශයෙන් ගත් කල්හි මෙය සත්‍ය යැයි පෙනුන ද අනුභූතිවාදී දාර්ශනික ඇසින් බලන විට මින් ගම්‍ය කරනුයේ නැවත දේවවාදයකට ගමන් කර ඇති බවයි.

**ඩේවිඩ් හ්‍යුම්**

නූතන දර්ශනයෙහි සාකච්ඡා වන අවසාන අනුභූතිවාදී දාර්ශනිකයා වනුයේ හ්‍යුම්ය. අනුභූතිවාදී දාර්ශනිකයන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි හ්‍යුම් එහි ප්‍රබලයා හෙවත් ප්‍රධාන දාර්ශනිකයා වශයෙන් පෙන්වා දිය හැකිය. ලොක් ආරම්භ කළ අනුභූතිවාදී සම්ප්‍රදාය උසස් තත්වයට ගෙන ඒමේ ගෞරවය හ්‍යුම්ට හිමි වේ. 'වර්ෂ 1739 සහ 1752 අතර තුර හ්‍යුම් විසින් ලියන ලද ඔහුගේ අදහස් දර්ශන ඉතිහාසය වෙනස් වන්නා වූ මොහොත විය. මේ බව ඔහුගේ මිතුරන් මෙන්ම හතුරන් ද පිළිගනිති' (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 190). 'මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ විවරණයක්, මනුෂ්‍ය අවබෝධය

පිළිබඳ විභාගය, ආචාර ධර්ම සහ දේශපාලන රචනා, සදාචාරයේ ධර්මතා පිළිබඳ විභාගය, ආගමේ ස්වාභාවික ඉතිහාසය, ස්වාභාවික ආගම පිළිබඳ සංවාදයන්, විවරණයන් සතරක්, එංගලන්තයේ ඉතිහාසය' ආදී කෘති මගින් හ්‍යූම් තම අදහස් ඉදිරිපත් කොට තිබේ. හ්‍යූම් සිය කෘතහස්ත දැනුම උපයුක්ත කරමින් ක්‍රිස්තියානි පල්ලි සංස්ථාව විවේචනය කරමින් එහි ඇති අර්ථ ශූන්‍යත්වය පැහැදිලි කළ බව හඳුනාගත හැකිය. එහෙත් පැවති දේවවාදී අදහස් විවේචනය කරමින් සිය පැහැදිලි කිරීම් සිදුකොට ඇති බැවින් හ්‍යූම්ට ලැබිය යුතු වූ වරප්‍රසාද නොලැබුණි. විශ්වවිද්‍යාල මහාචාර්ය තනතුරුවලට අයදුම්පත් යොමු කළ ද ඒවා ඔහුට නොලැබිණි.

හ්‍යූම්ට අනුව දැනුම බිහි වනුයේ ප්‍රත්‍යක්ෂයෙනි. ප්‍රත්‍යක්ෂය යනුවෙන් මොහු දක්වා ඇත්තේ ඉන්ද්‍රිය අනුභූතියයි. ප්‍රත්‍යක්ෂයට ගෝචර වන අරමුණු අංශද්වයක් ඔස්සේ විස්තර කර තිබේ. උපස්ථිතීන් (Impressions), සංකල්ප (Ideas) යනුවෙන් දැක්වෙනුයේ ඒවාය. හ්‍යූම්ට අනුව මනස පවතින්නක් නොවේ. එය ක්‍රියාවලියකි. උපස්ථිතීන් යනුවෙන් දක්වා ඇත්තේ මනසට ගෝචර වන අරමුණුය. එම අරමුණු හේතුවෙන් ඇතිවන උපස්ථිතීන් පිළිබඳව මනස ආවර්ජනය කිරීමෙන් බිහිවන ප්‍රත්‍යක්ෂය සංකල්ප වන බව හ්‍යූම් දක්වයි. දැනුම බිහිවනුයේ මෙම උපස්ථිතීන් හා සංකල්ප මගිනි. මේ අනුව දැනුම බිහිවනුයේ ප්‍රත්‍යක්ෂයෙනි. උපස්ථිතීන්ගෙන් තොර යමක් වේ නම් එය දැනුමක් නොවේ. එබැවින් මොහුගේ ඥානවිභාගීය එළඹුම ආනුභූතික වේ. හ්‍යූම් තම ආනුභූතික වූ ඥානවිභාගය උසස් ඥානවිභාගයක් කරනු වස් කරුණු තුනක් දක්වා තිබේ.

1. සාදෘෂ්‍ය පිළිබඳ සම්බන්ධය (Resemblance)

2. සමීප බව පිළිබඳ සම්බන්ධය (Contiguity)

3. හේතුව හා ඵලය පිළිබඳ සම්බන්ධය (Cause and effect)

ඒ අනුව මෙම සම්බන්ධයන් එකක් හෝ සියල්ල හේතු වී සංකල්ප බිහි වන බවත් ඉන් ඥානය බිහි වන බවත් හ්‍යූම් දක්වයි. අනුභූතිවාදය සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි පූර්ව දාර්ශනිකයන් දෙදෙනාට වඩා උසස් ඥානවිභාගයක් හ්‍යූම් බිහිකොට තිබේ. පූර්ව

අනුභූතිවාදීන් වන ලොක්ට හා බර්ක්ලේට දෙවියන් වහන්සේගේ සෙවනැල්ලෙන් මිදිය නොහැකි විය. එහෙත් හ්‍යුම් ගොඩනගනුයේ සැබෑ අනුභූතිවාදයකි. ඒ තුළ ඥානවිභාගයක් විනා දේවවාදයක් නොමැත. මොහු බාහිර ලෝකය සම්බන්ධයෙන් දක්වනුයේ බාහිර ලෝකයේ වස්තු සැබවින් පවතින්නක් නොව ඒවා විශ්වාසයන් සමූහයක් බවයි (ධම්මානන්ද හිමි, 2021, 79). මීට පූර්වයෙන් සිටි දාර්ශනිකයන්ගේ චින්තනය ලොප් වනුයේ බාහිර ලෝකයේ පැවැත්ම සම්බන්ධයෙන් සාකච්ඡා කරන විටය. එහෙත් හ්‍යුම් ඒ සඳහා සාර්ථක විසඳුමක් දක්වා තිබේ.

**ඉමානුවෙල් කාන්ට්**

බටහිර දර්ශනයෙහි නූතන යුගය නියෝජනය කරන යුග ප්‍රවර්තකයෙකු ලෙස ඉම්මැනුවෙල් කාන්ට් හඳුනාගත හැකිය. අසහාය දාර්ශනිකයා යන අන්වර්ථ නාමයෙන් ද මොහු හඳුන්වා ඇත. කාන්ටියානු දර්ශනයෙහි දැකිය හැකි විශේෂත්වය වනුයේ එතෙක් දර්ශනයෙහි පැවති බුද්ධිවාදී හා අනුභූතිවාදී ගැටුම සමෝධානය කිරීමයි. ශුද්ධ විචාරයේ පරීක්ෂාව, ප්‍රායෝගික විචාරයේ පරීක්ෂාව, විනිශ්චයේ පරීක්ෂාව, සදාචාරය පිළිබඳ පාරභෞතික විද්‍යාවේ පදනම හෙවත් මූලධර්ම, ස්වභාවික විද්‍යාවන් හෙවත් පාරභෞතික මූලධර්ම ආදී කෘති කිහිපයක් රචනා කර ඇති කාන්ට් බුද්ධිවාදී මෙන්ම අනුභූතිවාදී ආභාසය ලබා ඇත (අභයවංශ, 1997,15-16). කාන්ටියානු දර්ශනයෙහි ප්‍රධාන තේමාව වනුයේ ඥානවිභාගයයි. එහෙත් ඊට අමතරව කැපී පෙනෙන දාර්ශනික තේමා කිහිපයක් පවතින බව කරුණු අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

- ආචාරවාදී සිද්ධාන්තය
- සෞන්දර්යවාදය

කාන්ටියානු ඥානවිභාගය සුවිශේෂී වැදගත්කමකින් යුක්ත වේ. එතෙක් දර්ශනය සම්ප්‍රදායන් දෙකකට වෙන්ව ඥානයෙහි ප්‍රභවය සම්බන්ධයෙන් අනුභූතිවාදය හා බුද්ධිවාදය යන ප්‍රභේදය යටතේ දියත් විණි. කාන්ට් මෙම සම්ප්‍රදායන් ද්විත්වය එකතු කරමින් ඥානය බිහිවන බව දක්වයි. ඥානයේ පදනම සඳහා තාර්කික චින්තනයත් එනම් කාන්ට්ගේ වචනවලින් සඳහන් කරන්නේ නම් ප්‍රාග් ආනුභූතික

සංකල්ප සහ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හෙවත් පශ්චාද් ආනුභූතික දත්ත හේතු වේ. මෙය බුද්ධිවාදය හා අනුභූතිවාදය එකතු කිරීමකි (ධම්මානන්ද හිමි, 2021, 81).

කාන්ට්ට අනුව බුද්ධියේ කොටස් දෙකකි. සංවේදනීය පදාර්ථ හා අවබෝධනීය පදාර්ථ යනුවෙන් හැඳින්වෙනුයේ ඒවාය. මෙම පදාර්ථ ද්විත්වය මගින් සිය ඥානවිභාගය පිළිබඳ අදහස ඉදිරිපත් කරන කාන්ට් සංවේදනීය පදාර්ථ ඔස්සේ ලැබෙන සංජානනයන් අවබෝධනීය පදාර්ථ මගින් ඥානයක් බවට පත් කරවන බව දක්වා ඇත. සංවේදනීය පදාර්ථය කාලය හා අවකාශය යනුවෙන් කොටස් දෙකකින් යුක්තය. අවබෝධනීය පදාර්ථ කොටස් හතරකින් විග්‍රහ කොට තිබේ. ඒ අනුව එතෙක් පිළිගත් බුද්ධිවාදී හා අනුභූතිවාදී අදහස් සාරය වශයෙන් ගෙන කාන්ට් නවතම ඥානවිභාගීය විග්‍රහයක් සිදුකොට තිබේ. එය ඥානවිභාගීය ක්ෂේත්‍රයෙහි සිදු වූ දැවැන්ත පෙරලියක් බැවින් කොපනිකන් විප්ලවය හා සමාන යැයි විචාරකයෝ දක්වති.

**ජෝර්ජ් හේගල්**

නූතන දර්ශනයෙහි අවසාන දාර්ශනිකයා වශයෙන් හේගල් හඳුනාගත හැකිය. ඥානවිභාගීය වශයෙන් මෙතෙක් පැමිණි ගමන් මග වෙනස් කරමින් දැඩි විඥානවාදයක් ඉදිරිපත් කළ දාර්ශනිකයෙකු ලෙස මොහු පෙන්වා දිය හැකිය. ජර්මනිය, මහා බ්‍රිතාන්‍ය හා ඇමරිකාව ආදී රටවල්වල එකල පිළිගැනුණ එකම දර්ශනවාදය වූයේ හේගේලියානු විඥානවාදයයි. විඥානවාදී දාර්ශනික අදහස් ග්‍රීක යුගයේ දැකිය හැකි වුවද ඒ සියල්ලක් කැටි කොට විඥානවාදය පාරප්‍රාප්තියට පත් කරනුයේ හේගල් විසිනි. හේගල්ට අනුව මනුෂ්‍ය සභ්‍යත්වයෙහි ඇරඹි දර්ශනයෙහි තාර්කික අවසානය තමාගේ පරම විඥානවාදී දර්ශනය වේ (කලන්සූරිය, නූතන බටහිර දර්ශනය, 2007, 321). නමුත් සමකාලීන දර්ශනයෙහි නැඟීමත් සමඟ විඥානවාදී පදනම බිඳ වැටිණි. හෛඩෙගර්, කාල් ජැස්පර්ස්, ඇල්බෙයා කැමූ, ජීන් පොල් සාත්‍රේ, කාල් මාක්ස්, බට්‍රන්ඩ් රසල් වැනි දාර්ශනිකයන්ගේ මැදිහත් වීමෙන් බිහි වූ සත්වාදය, මාක්ස්වාදය, සාංදෘෂ්ටිකවාදය, තර්කානුසාරී අණුවාදය වැනි දාර්ශනික ප්‍රවණතාවන් එයට හේතු විය.

මේ ආකාරයෙන් විඥානවාදය බිඳ වැටීම සටහන් වනුයේ එහි ඇති අධිභෞතිකවාදී ස්වරූපයයි. හෙගල් සිය දර්ශනය සම්බන්ධයෙන් අධිමානසික තත්වයකින් යුක්ත වූවෙක් බව ඔහුගේ පහත ප්‍රකාශයෙන් හඳුනාගත හැකිය.

'කිසියම් මිනිසෙකු මා තේරුම්ගත්තේ වුවත් ඔහු මා තේරුම් නොගත්තේ වේ'.

හේගේලියානු දර්ශනය අධ්‍යයනය කිරීමේදී හමුවන ප්‍රධාන මූලය දයලෙක්තිකය හෙවත් අපෝහකයයි (Dialectical law). අපෝහකය නවතම විධික්‍රමයක් ලෙස හේගල් භාවිත කර තිබේ. මෙම රීතියෙන් මනුෂ්‍ය සභ්‍යත්වයේ විකාශය විස්තර කළ හැකි බව මොහුගේ අදහසයි. එකින් එකට ප්‍රතිවිරුද්ධ බලවේග දෙකක් ගැටීම නිසා නවතම තත්වයක් බිහි වේ. එම නවතම බිහි වූ දෙයට ප්‍රතිවාදී බලවේගයක් ඇති වේ. එම බලවේග ගැටීමෙන් තවත් නවතම දෙයක් බිහි වේ. හේගල් දක්වනුයේ යථාභූතයේ පරිණාමය මේ ආකාරයෙන් ප්‍රතිවිරුද්ධ ගැටීමෙන් ඇතිවන පරිණාමයෙන් බිහිවන බවයි (ධර්මසිරි, 2007) 164). මෙම ක්‍රියාවලිය කොටස් තුනක් ඇසුරින් පැහැදිලි කොට තිබේ.

ප්‍රවාදය (පවතින දෙය) (Thesis)

ප්‍රතිවාදය (Antithesis)

සහවාදය/සංවාදය (synthesis)

මෙම හෙගේලියානු අපෝහකය කාල් මාක්ස්ගේ අවධානයට ලක්ව ඇත. එහෙත් මාක්ස් සඳහන් කොට ඇත්තේ ඔලුවෙන් සිටගෙන සිටි හේගල් තමා කකුල් දෙකෙන් සිටවූ බවයි. හේගේලියානු විඥානවාදී විග්‍රහය දාර්ශනික වශයෙන් ප්‍රබල සංවාද ඇති කරන ලද්දකි. එම සංවාදයන්හි ප්‍රතිඵලය වනුයේ පූර්වයෙන් දක්වන ලද පරිදි නවතම දාර්ශනික කථිකා නිර්මාණය වීමය. එනම් සමකාලීන දර්ශනයෙහි ආරම්භයයි.

## සමාලෝචනය

මධ්‍යතන යුගයෙහි අවසානයත් සමඟ එළඹෙන දාර්ශනික ප්‍රවණතාව නූතන දර්ශනයයි. නූතන දර්ශනයෙහි ආරම්භය ඩේකාට්ගෙන් සනිටුහන් වුවද ඒ සඳහා තවත් දාර්ශනික, විද්‍යාත්මක, ආගමික ආදී වූ අංශ දායක වී ඇති බව කරුණු අධ්‍යයනයෙන් හඳුනාගත හැකිය. එහෙත් නූතන දර්ශනයෙහි අවසානය සම්බන්ධයෙන් ඒකමතිකත්වයක් නොමැත. ඒ සම්බන්ධයෙන් පවත්නා විවිධ මත මෙහි ඇතුලත් කළ අතර හේගල් නූතන දර්ශනයෙහි අවසාන දාර්ශනිකයා වශයෙන් යෙදීම කෙතරම් යුක්ති සහගත ද යන්න පැහැදිලි කර ඇත. ඒ අනුව ඩේකාට්ගේ සිට හේගල් දක්වා වූ දාර්ශනිකයන්ගේ ප්‍රධාන දාර්ශනික එළඹුම් මෙහිදී සාකච්ඡාවට ලක්කොට ඇත. එහෙත් මධ්‍යතන යුගයෙහි පැවති දේවවාදී ආභාෂයෙන් මිදීමට ඇතැම් දාර්ශනිකයන්ට නොහැකි වී ඇති බව ගම්‍ය වේ. වරින් වර ඍජුව හෝ වක්‍රව දේවවාදී සංකල්ප මතු වීම ඊට හේතුවකි. සමස්තයක් වශයෙන් ඥානවිභාගය, ආචාර විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, අධිභෞතික විද්‍යාව, දේශපාලන දර්ශනය ආදී දාර්ශනික තේමාවලින් යුක්ත, නවතම දර්ශනයන්ට මාවත් විවර කරණ දාර්ශනික අවධියක් ලෙස නූතන දර්ශනය පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අභයවංශ, කපිල. (1997) ඉමැනුවෙල් කාන්ට්ගේ ඥානවිභාගය. කැලණියඃ පාලි හා බෞද්ධ පශ්චාද් උපාධි ආයතනය-කැලණිය විශ්වවිද්‍යාලය.

එදිරිසිංහ, දයා සහ ඥානදාස පෙරේරා. (2001) දාර්ශනික විමර්ශන. දෙහිවලඃ වත්මා ප්‍රකාශකයෝ.

කලංසූරිය, ඒ.ඩී.පී. (1987) දර්ශනය හැඳින්වීමක්. කොළඹඃ ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

කලංසූරිය, ඒ.ඩී.පී. (2007) නූතන බටහිර දර්ශනය. බත්තරමුල්ලඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

විදානගමගේ, කුලසේන. (1997) දාර්ශනික ගැටලු. නාරම්මලඃ කතෘ ප්‍රකාශන.

ධම්මානන්ද හිමි, හෝමාගම. (2021) බෞද්ධ විශ්ලේෂී දර්ශනය. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මසිරි, ගුණපාල. (2007) දාර්ශනික ප්‍රශ්න. බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

විදානගම, චාමලී රුවන්දිකා. (2009) දාර්ශනික විමර්ශා නාරම්මල: කර්තෘ ප්‍රකාශන.

Russell, Bertrand. (1945) A History Of Western Philosophy, Simon And Schuster, New York.

Scruton, Roger (1995) A Short History Of Modern Philosophy From Descartes To Wittgenstein, Second Edition, Routledge, London.

Weith, John. (1907) The Method Meditation And Selections From The Principles Of Descartes. Black Wood, London.

Blackburn, Simon. (2016) Oxford Dictionary Of Philosophy. United Kingdom: Oxford University Press.

https://www.britannica.com/biography/Niccolo-Machiavelli Accessed on 23rd may 2021.

https://plato.stanford.edu/entries/hobbes-moral/ Accessed on 23rd may 2021.

https://www.oxfordlearnersdictionaries.com/definition/english/rationalism?q=rationalism Accessed on 24rd may 2021

https://www.rep.routledge.com/articles/thematic/rationalism/1 Accessed on 24rd may 2021

https://www.rep.routledge.com/search?searchString=empiricism&newSearch= Accessed on 29rd may 2021.

https://newlearningonline.com/literacies/chapter-11/john-locke-on-empirical-knowledge Accessed on 29rd may 2021.